The Journal of Studies in Humanities

Volume 5 (II) 2019

Department of Humanities, Rajarata University of Sri Lanka

# ශ්‍රී ලාංකේය උරුම කළමනාකරණයේ ස්වාභාවය හා කාලීන අභියෝග පිළිබඳ විමර්ශනයක්

**ඩබ්.එම්. චින්තක සඳරුවන්**

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය,

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ,

Email: Chinthakasandaruwan13@gmail.com

**Abstract**

The culture of this country, which is in tune with Buddhism, marks a historical evolution after the 3rd century BC. The Ceylonese, who inherited a civilized culture that began in this way, became a full-fledged British colony in the 1815s. During this period various interventions have taken place regarding the heritage of this country. Accordingly, it is important to study the nature of heritage management in the country during this period and to look at the management challenges that have arisen over time.

**Keywords:** heritage, management, cultural, religious background, current challenges

## හැඳින්වීම

උරුමය යන්න ප්‍රධාන වශයෙන් සංස්කෘතික හා ස්වාභාවික ලෙස වර්ග කළ හැකි වේ. ලාංකේය පුරාවිද්‍යාවේ උරුමය මෙරට භූ තලය නිර්මාණය වූ යුගය දක්වාම විහිද යන අතර සංස්කෘතික වශයෙන් මෙරට උරුමය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා ව්‍යාප්ත වේ. ලෝක උරුම නිර්ණායක අනුව මෙරට ලෝක උරුම ස්ථාන අටක් මේ වන විට නම්කර ඇති (http://whc.unesco.org/en/statesparties/lk) අතර ඒ අතර සංස්කෘතික උරුම හයක් ද ස්වාභාවික උරුම දෙකක් ද වේ. මෙරට සංස්කෘතික උරුම පිළිබඳ සාධක ඉති ඉහල වන අතර ක්‍රි.පූ. 3 වැනි සියවස මෙරට සංස්කෘතික උරුමයේ වැදගත් කාල වකවානකුවක් නියෝජනය කරනු ලබයි. එයට හේතු වන්නේ මෙරට සංස්කෘතික වශයෙන් නව දර්ශනයක් මත පදනම් වෙමින් සමාජ ක්‍රමය බුදු දහමත් සමග වෙනසකට ලක් වීමයි. එතැන් සිට සියවස් ගණනාවක් යනතෙක් මෙරට මානව ක්‍රියාකාරීත්වය තුළ සංස්කෘතික වූ නිර්මාණයන් බිහිකිරීමත්, නවීකරණවයත් පවත්වාගෙනයාමාත් සිදුකර ඇති බවට සාධක පුරාවිද්‍යාත්මකවත්, සාහිත්‍ය මූලාශ්‍රය මගිනුත් අනාවරණය වේ. බුදු දහම කේන්ද්‍රගතව පවත්වාගෙන ගිය මෙරට උරුමය යම් යම් අවස්ථාවන් තුළ දී බිඳ වැටීම් ද හඳුනාගත හැකි

වේ. කෙසේ වෙතත් පුරාවිද්‍යාව විෂයක් ලෙස වර්ධනය වීමත්, ඒ හා බැඳුණු සංකල්පයන්ගේ වර්ධනයත් සමග උරුමය පවත්වා ගැනීම සඳහා විවිධ යෝජනාවලි සකස් කරයි. එසේම කාලීන වශයෙන් වූ අභියෝග මත ද උරුමයේ ආරක්ෂාව හා පවත්වා ගැනීම සඳහා විවිධ වූ ක්‍රියාකාරකම් සිදු වූ බව හඳුනාගත හැකි වේ. ආක්‍රමණ, විනාශ කිරීම්, සංවර්ධන කටයුතු ආදිය එහි දී ප්‍රමුඛ වේ. මෙහි දී මෙරට උරුම කළමනාකරණයේ ස්වරූපයත් කාලීන වශයෙන් උරුම කළමනාකරණයේ දී පවතින අභියෝග පිළිබඳ ව සොයා බැලීමටත් අපේක්ෂා කෙරේ.

**මූලාශ්‍රය අධ්‍යයනය**

උරුමය යන්න මිනිසා විසින් හෝ මිනිසාගේ මැදිහත් වීමකින් තොරව නිර්මාණය වූ විශ්මය දනවන හෝ ලෝකයටම පොදු වූ ස්ථාන හා සිදුවීම් ලෙස හඳුන්වා දිය හැකි වේ. උරුම කළමනාකරණය යන සංකල්පය මෑත කාලීනව සංකල්පීය වශයෙන් දියුණු වූ ද මානව මැදිහත් වීමෙන් බිහි වූ බොහෝ දෑ ආරක්ෂා කර ගැනීම සඳහාත්, පවත්වා ගැනීම සඳහාත් ආදි මුතුන්මිත්තන් විසින් විවිධ වූ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇති බව හඳුනාගත හැකි වේ. එකී ක්‍රියාකාරීත්වය අධ්‍යනය කිරීමෙන් දී විෂයාත්මක මෙන්ම සංකල්පීය වශයෙන් මෙම සංකල්ප බිහි වූ බව හඳුනාගත හැක. පුරාවිද්‍යාව විෂයක් ලෙස වර්ධනය වීමට මූලිකව බලපානු ලබන්නේ මිනිසා තුළ ඇති වූ කුතුහලයයි. මිනිසා තම අතීත මුතුන්මිත්තන් නිර්මාණය කළ විස්මිත නිර්මාණ සොයා යාමට පෙළඹීමත් ඒ මත පදනම් වූ ගවේශන, කැනීම් හරහා යුරෝපය පුරා පුනරුදයක් ඇතිවන අතර පහළොස් වැනි සියවසවන විට විෂයක් වශයෙන් පුරාවිද්‍යාව ආරම්භ වීමට අවශ්‍යය පසුබිම නිර්මාණය වේ (මැන්දිස් 2015:09). පසුව ඇතිවන පුරාවිද්‍යා උරුමය සොයා බැලීමට දක්වන උනන්දුව මෙම විෂය දියුණු කිරීම සඳහාත් සංකල්ප ඉදිරිපත් වීමටත් බලපෑ බව හඳුනාගත හැකි වේ. ඇමරිකාව විසින් සිදු කරනු ලැබූ විශාල සංවර්ධන ව්‍යාපෘති හේතු වෙන් 1959 දශකයේ දී පුරාවිද්‍යා උරුමයන්ට හානි පැමිණවීම් සිදු වූ අතර මෙම නිසා 'ගලවා ගැනීමේ පුරාවිද්‍යාව' (Rescue Archaeology) බිහි වේ. ලෝක ඉතිහාසය තුළට මෙහි විශේෂ බලපෑමක් එල්ලවන්නේ 1959 දී ඊජිප්තුවේ නයිල් නදිය හරස් කර ආස්වාන් වේල්ල ඉදිකිරීමත් සමඟ වේ. අබුසිම්බල් හා ෆයිලි යන පුරාණ දේවස්ථාන ජලයෙන් යටවීමත් සමඟ ඇතිවන තත්ත්වය පාලනය කිරීම සඳහා (ගුණවර්ධන, 2005: 96-97) පැරණි ස්ථානයෙන් ගලවා ඉවත් කිරීම යන සංකල්පය මෙම නව විෂය විහිවීමට හේතු සපයයි. 1960 දශකයේ දී කාලීනව ඇතිවූ ගැටලු සඳහා පිළියම් සෙවීමේ අරමුණින් පර්යේෂණ මත පදනම් වූ 'නව පුරාවිද්‍යාව' (New Archaeology) බිහිවීමත් සමග පුරාවිද්‍යා උරුමයේ සුරක්ෂිතතාවය සඳහා නෛතිකව පැවති ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් වන ලදි (රාජපක්ෂ, 2001:21). 70 දශකය පුරාවිද්‍යා උරුම කළමනාකරණය සම්බන්ධයෙන් වැදගත් යුගයක් ලෙස දැක්විය හැකි වේ. 'සංස්කෘතික සම්පත් කළමනාකරණය' (Cultural Resource Management) නම් සංකල්පය බිහිවීම (Fagan 1991:506) 'පුරාවිද්‍යා උරුම කළමනාකරණය' (Archaeological Heritage Management) සංකල්පය බිහි වීම (Saunders 1986:152), ගෝලීය වශයෙන් උරුමයේ ආරක්ෂණය සඳහාත් පවත්වාගෙන යාම සඳහාත් සංකල්පීය වශයෙන් ඉතා වැදගත් යොමුවක් ලබා දෙන ලදී.

වත්මන් යුගයවන විට මෙම සංකල්පයන්ගේ වැදගත් වර්ධනීය අවස්ථාවක් ලෙස 'තිරසාර උරුම කළමනාකරණ' (Sustainable Heritage Management) සංකල්පයේ බිහිවීම

දැකගත හැකි වේ (රාජපක්ෂ 2001: 21). මෙතුළින් උරුමයේ ආරක්ෂාව පමණක් නොව ආර්ථික සුරක්ෂිතතාව, පාරිසරික සුරක්ෂිතතාව, සමාජ සුබ සිද්ධිය ආදී විෂය පරාසයන් ගණනාවක් ආවරණය වීමත් හඳුනාගත හැකි ය. මෙම නෛතික සංකල්ප කෙසේ වෙතත් ලාංකේය සමාජය තුළ සාම්ප්‍රදායික වශයෙන් රැගෙන එනු ලැබූ පුරාවිද්‍යාත්මක උරුම ආරක්ෂණය සඳහා ගෙන ඇති පියවරයන් පිළිබඳව ද මෙහි දී සැළකිලිමත් විය යුතු වේ. මන්ද ඒ පිළිබඳ සාධක පුරාවිද්‍යාත්මකව මෙන්ම සාහිත්‍යය මූලාශ්‍රය සාධක තුළින් ද හඳනාගත හැකි වීමයි.

## අධ්‍යයන ක්‍රමවේදය

ලාංකේය උරුම කළමනාකරණයේ ස්වරූපයත්, කාලීන අභියෝග පිළිබඳ ව විමසීමේ දී ප්‍රාථමික හා ද්වීතික මූලාශ්‍රය පරිශීලනය කරන ලදී. එසේම පුරාවිද්‍යාත්මක සමගාමී ආයතනික ව්‍යුහයන්ගේ ක්‍රියාකාරීත්වය සොයා බැලීම, සම්මුඛ සාකච්ඡා සිදු කිරීම හා ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ලබාගත් තොරතුරු අන්තර්ගත කරනු ලැබේ.

## අධ්‍යයන ප්‍රතිඵල

මෙරට සංස්කෘතික උරුමය ප්‍රධාන වශයෙන් ප්‍රාග් ඓතිහාසික යුගයේ සාධකත්, අදින් වසර සියයක් දක්වා පැරණි වූ වන සියලුම සාධක පිළිබඳ නෛතික වශයෙන් අදාළ කර ගත හැකි වේ. මෙරට සංස්කෘතික උරුම කළමනාකරණය කිරීමේ ස්වරූපය අධ්‍යයනයේ පහසුව සඳහා පහත ලෙස දැක්විය හැකි ය.

01. බෞද්ධ ආගමික සංකල්පය තුළ උරුම කළමනාකරණ සංකල්පය

02. දේශපාලනික ධාරාව තුළ උරුම කළමනාකරණ සංකල්පය

03. සාරාධර්ම, චාරිත්‍ර වාරිත්‍ර හා සම්ප්‍රදායන් තුළ උරුම කළමනාකරණ සංකල්පය

04. යටත් විජිත යුගය තුළ උරුම කළමනාකරණ සංකල්පය

05. ආයතනික වශයෙන් උරුම කළමනාකරණ සංකල්පය

බෞද්ධ ආගමික සංකල්පය මත උරුම කළමනාකරණය පිළිබඳ ව පැහැදිලි නිර්දේශ බුදුන් වහන්සේ විසින් භික්ෂූන්ට අනුදැන වදාළ විනය පිටකය තුළින් හඳුනාගත හැකි වේ. එහි චුල්ලවග්ගපාලියේ සේනාසනක්ඛන්දකය මෙහි දී ඉතා වැදගත් වූ සාක්ෂි සපයයි.

පුරාවිද්‍යා උරුම කළමනාකරණයේ ඉතිහාසය බෞද්ධ දර්ශනයේ එන මූලික ඉගැනිවීම් කේන්ද්‍රකර ගෙන ආභාසය ලබා ඇති බව පැහැදිලි වේ. බුදුන් වහන්සේ ජීවත්ව සිටි අවධියේ දී සංඝයා වහන්සේලා සඳහා විහාරාරාම ගොඩනැගිලි තම වාසස්ථාන ලෙස පරිහරණය කිරීමට අනුදැන වදාළ අතර ඉක්බිතිව ඒවායේ ඇති විය හැකි කැඩී බිඳීයාම්, ක්ෂයවීම් ආදී ස්වාභාවික උපද්‍රව සඳහා අලුත්වැඩියා කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ව ගත යුතු ක්‍රියාමාර්ගයන් විස්තර කර ඇත. ඒවා මෙසේය.

01. සුදු පැහැ, කළු පැහැය හා ගුරු පැහැ පිළියම් කිරීම.

02. රළු බිත්තියේ සුදු පැහැය නො රැඳෙන විට දහයියා කුඩු අත්ලෙන් තුනී කොට සුදු පැහැය සකස් කිරීම.

03. ගුරු පැහැය නො රැඳෙන විට කුඩු මුසු මැටි අත්ලෙන් මැද ගුරු පැහැය ගැනීම.

04. බිත්තියේ තැනින් තැන බිංදු වශයෙන් උස්ව නැඟී සිටියේ නම් රෙදි කඩකින් පිස දැමීම.

05. බිම කළු පැහැය ගැනීම සඳහා ගැඩවිලි පස්, නෙල්ලි හා මැලියම් අත්ලෙන් මැද ගෑම.

06. විහාර බිත්ති දිරන විට ලී විද කණු සිටුවා බිත්ති බැඳීම.

07. විහාර බිත්ති තෙමෙන විට එහි ආරක්ෂාව සඳහා වාසුගොම, අළු මැටි එකට මිශ්‍රකොට පැලැල්ලක් එයට සම්බන්ධ කර ගැනීම (චුල්ලවග්ගපාලිය 2006 : 209-211).

මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ බෞද්ධ සංඝයා වහන්සේලා තම ආරාම නඩත්තු කළ බවත් ක්‍රිස්තු පූර්ව යුගයේ සිටම කළමනාකරණ කටයුතු පිළිබඳ ව දැනසිටි බවත් ය. අංගුත්තර නිකායට අයත් චුල්ල වග්ගයේ ද බෞද්ධ සංඝයා වහන්සේලා සඳහා විහාරාරාම ඉදිකිරීම, නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි මැදිහත් වීමට අනු දැන වදාළා ඇත.

''අනුජානමි භික්ඛවේ නවකම්මං දාතුං
නවකම්කො භික්ඛවේ භික්ඛු උස්සුක්කං
ආපජ්ජිස්සති කින්ති නූ ඛෝ විහාරො
ඛිප්පං පරියොසනං ගච්ඡෙයයා ති
ඛණ්ඩඵුල්ලං පටිසංඛරිස්සති''

(චුල්ලවග්ගපාලිය 2006 : 170)

'නවකර්ම කරන්නා වූ භික්ෂුව විහාර කටයුතු අවසානය කෙසේ කරන්නේ දැයි උත්සහවත් වන බවත්, කැඩීබිඳී ගිය තැන් ප්‍රතිසංස්කරණය කරන බව'ත් මින් ගම්‍ය කරයි. මෙහි 'සංරක්ෂකයා' හා වැඩ 'සැලසුම්කරුවා' යන චරිත ද්විත්වය පිළිබඳ ව දක්වා ඇත (මල්සිරි 2011:37). නවකර්ම සිදු කිරීමේ දී උරුමයෙහි භෞතික ස්වරූපය මත කාර්ය සාධන කාලය තීරණය කිරීමට ද අනුමැතිය ලැබි ඇති ආකරය ද චුල්ලවග්ග පාලියේ දක්වා ඇත.

''අනුජානාමි භික්ඛවේ අකතං වා විහාරං විප්පකතං වා නවකමමං දාතුං
ඛුද්දකෙ විහරේ කම්මං ඔලොකෙත්වා ඡප්පංච වස්සිකං නවකමමං දාතුං
අඩ්ඪයෙයොගෙ කම්මං ඔලොකෙතවා සත්තට්ඨවස්සිකං නවකමමං දාතුං
මහල්ලකෙ විහාරේ පාසාදෙ වා කම්මං ඔලොකෙතවා දසදවාදසවස්සිකං
නවකමමං දාතුන් තී''

(චුල්ලවග්ගපාලිය 2006 : 210).

මෙහි දක්වා ඇති 'කම්මං ඔලොකෙතවා' යන්න තුළින් අදහස් වන්නේ 'කළ යුතු ව ඇති' යන්නයි. මෙමගින් වර්තමානයේ සිටන 'වැඩ පරික්ෂකවරයකු'ගේ හෝ 'බලපෑම් තක්සේරුකරුවකු'ගේ කාර්යය සිහි කරවන්නකි.

දේශපාලනික ධාරව තුළ උරුමයේ ආරක්ෂාව සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බැලීමේ දී රජවරු/ රාජකීය නිලධාරින් හා රාජකීය කාන්තාවන් විසින් සිදුකරනු ලැබූ මැදැහත් වීම් පිළිබඳව දීපවංසය, මහාවංසය වැනි ප්‍රථමක මූලාශ්‍රය ආශ්‍රයෙන් හඳුනාගත හැකි වේ. දේවානම්පිය තිස්ස (ක්‍රි.පූ. 250-210) රජු බුදු දහම පිළිගනිමින් මෙරට රාජ්‍ය ආගම බුදු දහම බවට පත් කරයි. ඒ අනුව අනුරාධපුර රාජධානියේ ඓතිහාසික යුගයේ ආරම්භය තිස්ස රජුගේ කාලසීමාව තුළ දී ආරම්භ වනු දැකගත හැකි ය (වත්තල 1998: 2). සංඝමිත්තාග මණයත් සමග පැමිණි විවිධ වෘත්තීය කුල පිළිබඳව වංසකතා සඳහන් කරන අතර ක්‍රමවත් ආකාරයෙන් බෞද්ධාගමික ගොඩනැගිලි හා වෙනත් නිර්මාණ ඉදිකිරීම් ආරම්භ කිරීම මෙම යුගයේ සිට ක්‍රියාත්මක වේ. එහි පළමු ඉදිකිරීම් අවස්ථාව ලෙස මහමෙවුනා උයන පූජා කිරීම දැක්විය හැකි ය (මහාවංසය 1996 :xv, 24-25). මේ සමඟම අනුරධපුර කලාපය තුළ විවිධ බෞද්ධ ආරාමයන් ඉදි කරන්නට විය. එසේම ඒවා පාලනය කිරීමත් නඩත්තුවත් සිදු කරන ලදි. මහාවංසය තුළ දක්වන පරිදි මිහිඳු හිමි ඇතුළු පිරිස පැමිණීමෙන් පසුව සංඝයාගේ පෝෂණ කටයුතු රජ මාලිගෙයින් සිදු වූ බව දක්වා ඇත (එම :xv, 178, 214). මෙම යුගයේ උරුමය කළමනාකරණ කිරීම පිළිබඳ පැහැදිලි සාධකයක් මහාවංසය තුළ සඳහන් වේ.

**වගු අංක 2:1**

**ථූපාරාම විහාරයේ සිදු කළ කළමනාකරණ කටයුතු හා සම්බන්ධ වූ පාලකයින්**

| කාර්යය | පාලකයා |
|---|---|
| ස්තූපයේ ආරක්ෂාවට ගල් ආවරණයක් සැකසීම | ලජ්ජිතිස්ස රජු (ක්‍රි.ව. 119-109) |
| කැඩී ඉඳී ගිය තැන් අලුත්වැඩියාව | ගොඨාභය රජු (ක්‍රි.ව. 253-266) |
| ස්තූපයේ උපරිබාගයේ රනින් ඡත්‍රයක් පැළඳවීම | පළමු වැනි උපතිස්ස රජු (ක්‍රි.ව. 368-410) |
| සමස්ත ස්ථූපය ප්‍රතිසංස්කරණය | ධාතුසේන රජු (ක්‍රි.ව. 459-477) |
| ධාතු ගර්භය, ස්තූපයේ පියස්ස ඇතුළු අලුත්වැඩියා කිරීම් | පළමුවැනි අග්ගබෝධි රජු (ක්‍රි.ව. 575-608) |
| කැඩී ඉඳී ගිය තැන් අලුත් වැඩියාව | දෙවැනි කස්සප රජු (ක්‍රි.ව. 650-659) |

(ගුණවර්ධන 2005:23; සුරවීර 1997: 105-113)

සංඝමිත්ත මහරහත් මෙහෙණිය ශ්‍රී මහා බෝධිය වැඩම කළ නැවෙහි පළුපත, කෙනිපානය හා තුඹහිටිය මහජන ප්‍රදර්ශනය සඳහා මෙහෙණවර තුනක් ඉදිකොට තැම්පත් කළ බව සඳහන් වේ (එම: xix,68-70) මෙය වර්තමාන උරුම කළමනාකරණ සංකල්පය තුළ ක්‍රියාත්මක වන ප්‍රධාන අංගයකි. උරුමයේ ආරක්ෂාව සඳහා ආරක්ෂිත ස්ථානයන් තුළ පුරාවස්තු ලෙස සලකා භාණ්ඩ හෝ ස්මාරක තැන්පත් කිරීමත් ප්‍රදර්ශනය කිරීමත් ජාත්‍යන්තරව පිළිගත් සංකල්පයකි. ලක්දිව ප්‍රථම ස්තූපය වශයෙන් පිළිගනු ලබන්නේ දේවානම්පියතිස්ස (ක්‍රි.පූ. 250-210) රජු විසින් ඉදිකරන ලද ථූපාරාමයයි (එම: xvii,24-65). එය ප්‍රථම ස්ථූපය වූ නිසාත් බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතුන්වහන්සේ තැම්පත් කර ඇති නිසාවෙනුත් පසුව රාජ්‍ය අනුප්‍රාප්තිකයන් මෙම උරුමයේ ආරක්ෂාව සඳහා විවිධ කටයුතු සිදු කළ බව හඳුනාගත හැකි ය.

මෙලෙස විවිධ රජ්‍ය පාලකයන් විසින් ථූපාරාමය සඳහා කළමනාකරණ කටයුතු සිදු කළා සේම අනෙකුත් විහාරාංග පාලනයටත් නඩත්තුව සඳහාත් කළමනාකරණ කටයුතු සඳහාත් අනුග්‍රහය දැක්වා ඇති බව මහාවංසය, දීපවංසය මෙන්ම සමන්තපාසාදිකාව ආදී සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය තුළින් හඳුනාගත හැකි වේ. මෙයට අමතරව සමකාලීනව ලියැ වී ඇති ශිලා ලේඛනයන් ද මෙහි දී වැදගත් වේ. හතර වැනි මිහිඳු (ක්‍රි.ව. 982-1029) රජුගේ මිහින්තලා පුවරු ලිපිය නිදසුන් ලෙස දැක්විය හැකි ය. ආරාම නඩත්තු කටයුතු, කළමනාකරණ කටයුතු මෙන්ම සේවය සපයන පිරිස් සඳහා දිය යුතු වැටුප් ප්‍රමාණයන් පිළිබඳ ව එහි පැහැදිළි ව දක්වා ඇත.

'... නො ගතැ යුතු මෙහෙයැ බද් මිනිසුන් කැමියන් තුමනට් මෙහෙ නො ගතැ යුතු අනොබ මෙහෙයට් නො දියැ යුතු

කතුමහසෑයෙහි නම්නවාමට් දම්ගම්යෙන් දුන් පයල ඇත්වෙහෙර් කැමියන් බලා ගෙනැ දාගැබ්හි

කම්නවාම් කැරැවියැ වියැ යුතු කිර්බඩ්පවු දාගැබෙහි අරකට් ඇල්ගම්යෙන් දුන් දෙකිරිය දී අරක්

කැරැවියැ යුතු දාගෙහි ඉසා මඟුල් මහසලපිළිමගෙහි ඉසා මහබෝය්ගෙහි ඉසා නයින්දැ ඉසා මිණිනා...' (කරුණාරත්න 2000 :44)

මෙහි දක්වා ඇති පරිදි,

'කැමියන් විසින් වෙහෙරෙහි මෙහෙයට අනුබද්ධ මිනිසුන් තමාගේ මෙහෙයට නොගත යුතු යි. පිට මෙහෙයටත් නොදිය යුතුයි. කතුමහසෑයෙහි ප්‍රතිසංස්කරණ කටයුතුවලට දම්ගම්යෙන් දුන් ලැල ඇත්වෙහෙර කැමියන් බලාගෙන දාගැබ ප්‍රතිසංස්කරණ කටයුතු කරවිය යුතුයි. කිරිපඬුපව් දාගැබෙහි ආරක්ෂාවට අල්ගම්යෙන් දුන් දෙකිරිය දී ආරක්ෂා කරවිය යුතු යි'

සාරධර්ම, චාරිත්‍ර වාරිත්‍ර හා සිරිත් විරිත් තුළින් ද උරුම ආරක්ෂණය හා කළමනාකරණය සඳහා ක්‍රියාත්මක වීමක් පැරණි සමාජයේ සිටම හඳුනාගත හැකි වේ. ජීවමාන උරුම ස්ථාන

පවත්වා ගැනීම සඳහාත් ඒ ආශ්‍රිත පුද පූජා සිදු කිරීමත් සාම්ප්‍රදායිකව වර්තමානය දක්වාම පවත්වාගෙන එනු ලැබේ. මෙයට හොඳම නිදර්ශකය වන්නේ දළඳා වහන්සේ වෙනුවෙන් පවත්වාගෙන එනු ලබන පුද පූජා වේ.

1815 දශකයේ සිට 1890 දශකය දක්වා වූ යටත් විජිත පාලන සමයේ දී නිල නොවන ආකාරයෙන් පුරාවිද්‍යා උරුමයේ කළමනාකරණය පිළිබඳ ව කටයුතු කර ඇත. මෙම යුගයේ දී ගවේශන කටයුතු, වාර්තාගතකරණය කටයුතු පසුකාලීන පුරාවිද්‍යා උරුමයේ ආරක්ෂාව හා කළමනාකරණය සම්බන්ධයෙන් වැදගත් කාර්යයභාරයක් ඉටුකර ඇත. 1817 වර්ෂයේ දී බ්‍රිතාන්‍ය ජාතික රැල්ෆ් බැක්හවුස් විසින් අනුරාධපුර, පොළොන්නරුව මින්නේරිය, කන්තලේ ආදී ප්‍රදේශවල සංචාරයක නිරත වී ඇති අතර පුරාණ උරුමයන් හා වැව් හා නටඹුන් හා ගොඩනැගිලිවල මිනුම් ලබාගැනීමට කටයුතු කර ඇත (එම : 67). 1829 දී බ්‍රිතාන්‍ය ජාතික කපිතාන් ෆාගන් පුරාණ උරුමයන් හී පැවති තත්කාලීන ස්වාභාවය පිළිබඳ ව ලංකා ගැසට් සඟරාවට තොරතුරු වාර්තා කිරීමක් ද සිදු කර ඇත. ජොනතන් ෆෝබ්ස් 1828 දී ශ්‍රී ලංකාවේ බොහෝ ස්ථානයන් හී සංචාරය කර පුරාවිද්‍යා උරුමයන්ගේ කාලීන වශයෙන් ශේෂව පැවති තත්ත්වයන් වාර්තා කළ බවත් ඒවායේ වටිනාකම් හා ඓතිහාසික කරුණු ඇතුලත් කරමින් කෘති සම්පාදනය කරමින් ප්‍රකාශයට පත් කිරීම ද සිදු කර ඇත. ෆෝබ්ස් වාර්තා අනුව අභයගිරි ස්තූපය එළි පෙහෙළි කිරීම 1828-1829 යුගයේ දී මුල්වරට සිදුව ඇති අතර එක් ධෛර්ය සම්පන්න භික්ෂුවක් එම කාර්ය කළ බව දක්වා ඇති අතර එක් අවස්ථාවක ස්තූපයේ එක් කොණක වූ බදාම පතුරක් ගැලවී අග මත පතිත වීම නිසා බරපතල ලෙස තුවාල ලැබූ බව සඳහන් කරයි (තෙන්නකොන් 2005 :408-409). මෙය මුල් යුගයේ ජේතවනාරාමය වැරදි ලෙස හඳුනාගනිමින් සිදු කළ ලේඛනයක්වන අතර මෙය වත්මන් ජේතවනාරාමය ස්තූපය ආශ්‍රිත ව සිදු වූ ස්තූප නඩත්තුවක් ලෙස නිවැරදි විය යුතු වේ. 1831 වර්ෂයේ දී අනුරාධපුර ඉපලෝගම අනුනායක ස්වාමීන් වහන්සේ විසින් මහනුවර සංඝ සභා මණ්ඩලය වෙත පුරාවිද්‍යා උරුමයන්ට සිදුව ඇති විනාශයන් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරමින් ඒවා ප්‍රතිසංස්කරණය කළ යුතු බව දන්වන අතර පසුව අනුරාධපුරයේ බෞද්ධ උරුමයන් ආරක්ෂා කිරීම එම මණ්ඩලයේ වගකීමක් ලෙස සළකා මැදිහත් වූ බව ද සඳහන් වේ (ගුණවර්ධන 2005: 67-68). 1840 දශකයේ දී භික්ෂූන් වහන්සේ කෙනෙකු විසින් සම්මාදම් කර එකතු කළ විශාල මුදලක් වැය කර ශ්‍රීමත් හර්කියුලිස් රොබින්සන් ආන්ඩුකාරයාගේ යුගයේ දී ථූපාරාමය ද ප්‍රතිසංස්කරණය කර ඇත. 1870 දශකයේ දී ආණ්ඩුවේ සහකාර ඒජන්තවරයා වූ එල්.සී. ලීසිං ගේ විශේෂ උනන්දුව හා කැපවීම මත අනුරාධපුරයේ බොහෝ නටබුන් සොයා ගන්නා ලදී. වැරදියට වටහා ගනිමින් ජේතවනාරාමය ලෙස එකී යුගයේ සලකන අභයගිරියේවන චමත්කාර සඳකඩපහණ සෙයාගන්නා ලද්දේ ද මොහුගේ උනන්දුව නිසාවෙනි. ලීසිං විසින් සොයාගන්නා ලද නටබුන් ආණ්ඩුව වෙනුවෙන් ඡායාරූප ගතකරන ලද්දේ ලෝටන් විසිණි. 1874 දී කපිතාන් හොග් විසින් ඡායාරූප ගැනීම් කටයුතු ආණ්ඩුව වෙනුවෙන් සිදු කළ අතර මූර්ති හා කැටයම්වල අච්චු ලබාගැනීමට ඔහුට අවශ්‍යය අමුද්‍රව්‍ය රජය විසින් සපයා තිබේ. ඔහු විසින් පිටපත් කරන ලද සෙල් ලිපි පසුව ගොල්ඩ් ස්මිත් හා මලර් විසින් පරීක්ෂා කර ඇති බව සඳහන් වේ (තෙන්නකොන් 2005 : 412-413). 1878 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයට සිදු ව ඇති හානිය පිළිබඳ ව වාර්තාවක් ග්‍රෙගරි විසින් යටත් විජිත ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. එය විද්‍යාත්මක වැඩ කොටසක් මෙහි

දී සිදු කර ඇති අතර එය '*Discovery and Preservation of Ancient Monument*' යන ලේඛනය තුළින් වාර්තා කර ඇත (ගුණවර්ධන 2005 :71). 1884-1885 වර්ෂවල දී පුරාවිද්‍යාත්මක ගවේෂන ගණනාවක් බාරෝස් විසින් සිදු කර ඇති අතර ඒ පිළිබඳ වාර්තාවක් ආණ්ඩුව වෙත ඉදිරිපත් කර ඇත (තෙන්නකොන් 2005 :435).

ආයතනික වශයෙන් 1890 දී පිහිට වූ පුරාවිද්‍යා දෙපාරතමේන්තුවත්, 1980 දශකයේ මධ්‍යම සංස්කෘතික අරමුදලත් සෘජු ලෙසම මෙරට පුරාවිද්‍යා උරුමයේ ආරක්ෂාව, කළමනාකරණය හා පවත්වාගෙන යාම සඳහා කටයුතු කරනු ලැබේ.1890 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටු වීමත් (ගුණවර්ධන 2005 :78) එච්.සී.පී. බෙල් ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් වශයෙන් පත්කිරීමත් (කරුණාරත්න 1990 :4) සමඟ පැරණි ක්ෂේත්‍ර ආශ්‍රිත ව ගවේෂණ හා කැණීම් පර්යේෂණාත්මක ස්වරූපයෙන් ආරම්භ විය. ස්මාරක හා ගොඩනැගිලි ක්‍රමාණුකූලව වාර්තාගත කිරීමේ කටයුතු මෙම යුගයේ සිට ඇරඹුණි. බෙල් විසින් ඉතා වටිනා මිනින්දෝරු සිතියම් සම්පාදනය කිරීම මෙහි දී වඩා වැදගත් වේ. බෙල්ගෙන් පසුව ඊ. ආර්. අයර්ටන් 1912-1913 යුගය දක්වා කොමසාරිස් ධූරයේ වැඩ කටයුතු කරමින් පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීමට කටයුතු කරයි. මෙම යුගයවන විට ප්‍රථම ලෝක සංග්‍රාමය ආරම්භ වීමත් ලෝකයේ බොහෝ රටවල් එයට සම්බන්ධ වීමත් නිසාවෙන් මෙම යුගයෙන් උරුමයන් සම්බන්ධයෙන් සිදු කරන ලද මැදිහත් වීම් අඩපණ වේ. 1922 වර්ෂයේ දී ආතර් මොරිස් හෝර්කාට් පුරාවිද්‍යා කොමසාරිස් ධූරයට පත් වීමත් සමඟ නැවත උරුමයන් සම්බන්ධයෙන් ක්‍රියාකාරී වැඩ පිළිවෙලක් ආරම්භ වීමට හේතු වේ. මෙම යුගයේ සිදු වූ විශේෂ සිදුවීම වූයේ කාලීන වශයෙන් වැදගත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමයි. ඒ අනුව හෝකාට් දක්වා ඇති පරිදි,

> 'පුරාවිද්‍යා ස්ථාන කැණීම් කිරීමෙන් ඉක්බිතිව එහි අවසාන ප්‍රතිඵලය වශයෙන් සංරක්ෂණ කටයුතු කිරීම අත්‍යවශ්‍ය බවත් එබඳු දීර්ඝ වැඩ කටයුත්තකට කිසියම් හෝ වැඩපිළිවෙලක් නොමැති නම් කැණීම් කටයුතු සිදු කොකල යුතු යි' (එම.) ලෙස දක්වා ඇත.

මෙම යුගයේ දී ශිලා ලේඛන පිළිබඳ විශේෂඥයකු වූ සෙනරත් පරණවිතාන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට එකතු වීම ද මෙරට පුරාවිද්‍යා ඉතිහාසයේ විශේෂිත අවස්තාවකි. හෝකාට්ගෙන් පසුව කොමසාරිස් ධූරය සඳහා ඒ.එච්. ලෝංහර්ස්ට් මහතා පත්වන අතර ඉන්දීය පුරාවිද්‍යාව පිළිබඳ හසල දැනුමක් පැවති ඔහු පොළොන්නරුවේ හින්දු ආගමික උරුමයන්ගේ ආරක්ෂා කිරීමට කටයුතු කරන ලදි. මෙම යුගයේ දී බෞද්ධ පුනර්ජීවණ ව්‍යාපාර හරහා උරුමය රැකගැනීම සඳහා කටයුතු කළ බව පෙනේ. බෙල්ගේ ඇතැම් ක්‍රියාවන් දැඩි ලෙස හෙලා දකිමින් මෙම පුනර්ජීවන කණ්ඩායම් ඉංග්‍රීසි ආණ්ඩුවට බලපෑම් කළ බව පෙනේ. පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිත ව සිදු කරන ලද නවීකරණයන් පුරාවිද්‍යාත්මක උරුමයයේ විනාශයට හේතුවන බව දක්වමින් දැඩි ලෙස විවේචනය කළහ. වලිසිංහ හරිස්චන්ද්‍ර, අනගාරික ධර්මපාල, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි වැනි පිරිස් මෙහි දි ප්‍රමුඛව ක්‍රියා කරන ලදී.

කෙසේ වෙතත් 1940 දී දේශීය මුලයකට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ධූරය හිමි වේ. ඒ සෙනරත් පරණවිතාන ශූරීන්ට වේ. මේ හේතුව නිසා ගැටලු ගණනාවක්

විසඳුණු අතර පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීම, ආචාරධර්ම හා මූලධර්ම මූලික කර ගනිමින් සංරක්ෂණ කටයුතුවල නියැලීම මෙම යුගයේ වැදගත් ලක්ෂණයන් වේ. එසේම පුරාවිද්‍යා උරුමයේ ආරක්ෂාව සඳහා 1940 අංක 09 දරණ පුරාවස්තු ආඥා පණත සම්මත කර ගැනීම ද වැදගත් කරුණක් වේ.

1958 දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තුළ පුරාවිද්‍යාව හැදෑරීම සඳහා අවස්ථාව ලබා දෙන අතර පේරාදෙණිය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලවලට ඒ සඳහා අවස්ථාව ලැබුණි. 1966 දී ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය බිහිවීමත්, පුරාවිද්‍යා කළමනාකරණ සංකල්පයේ ඉදිරි වර්ධනයට හේතු විය (එම: 227). 1960 දී අනුරාධපුර පැරණි නගරයේ ආරක්ෂාව සඳහා සංරක්ෂණ මණ්ඩලයක් පිහිටු වීම මෙම යුගයේ වැදගත් කාර්යයකි.

1960-1990 යුගයේ දී ස්ථිර වාස්තුවිද්‍යා සංරක්ෂණ අංශයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පිහිටුවීමත් මෙරට පුරාවිද්‍යා උරුම කළමනාකරණය සම්බන්ධයෙන් වැදගත් වූ කඩඉමකි. 1980 දශකය පුරාවිද්‍යාව සම්බන්ධයෙන් ඉතා වැදගත් යුගයක් වේ. පුරාවිද්‍යාවේ වර්ධනය සඳහා ප්‍රධාන ධාරාවන් දෙකක් මෙම යුගයේ බිහි වේ. එනම්,

01. ශාස්ත්‍රීය හා විද්‍යාත්මක ධාරාව ඔස්සේ පර්යේෂණ මට්ටමෙන් ආරම්භ වූ සංස්කෘතික ත්‍රිකෝණය හා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

02. දේශපාලන ධාරාවන් ඔස්සේ ක්‍රියාත්මක වූ උදාගම් සංකල්පය (ගුණවර්ධන 2005 :81)

සංස්කෘතික ත්‍රිකෝණය ප්‍රමුඛ කර ගනිමින් අනුරාධපුර, අභයගිරිය, ජේතවනාරාමය, පොළොන්නරු ආලාහණ පිරිවෙන, සීගිරිය, දඹුල්ල හා මහනුවර ආදී ව්‍යාපෘති හයක් ආරම්භ කරමින් පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීමට මැදිහත් වේ. මෙම කරුණු පුරාවිද්‍යා උරුම කළමනාකරණය සම්බන්ධයෙන් වැදගත් අවස්ථාවක් විය. 1990-1997 කාලයේ දී තිවංක පිළිමගෙය, දෙමළ මහා සෑය, රන්කොත් වෙහෙර සම්බන්ධ මැදිහත්වීම් ද මෙම යුගයේ කැපීපෙනේ. 1992 ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව බිහි කිරීමත් සමඟ පුරාවිද්‍යා කළමනාකරණ සංකල්පයේ ඉදිරි වර්ධනීය කටයුතු සඳහා ද හේතුවක් විය.

කෙසේ වෙතත් මෙහි දී වඩා ප්‍රමුඛව මෙම කළමනාකරණ ක්‍රමවේදයන්ට සාපේක්ෂව ඇතිව පවතින කාලීන අවශ්‍යතා, අභියෝග පිළිබඳ සොයා බැලිය යුතු වේ. ප්‍රධාන වශයෙන් නෛතික වශයෙන් උරුමය සම්බන්ධයෙන් පවතින සුරක්ෂිතතාවය, ආයතනික සුරක්ෂිතතාවය, මානව මූලික තිරසාර සංවර්ධන යෝජනා යන කරුණු පිළිබඳ පුරාවිද්‍යා උරුම කළමනාකරණය සම්බන්ධ පැහැදිලි අභියෝග හඳුනාගත හැකි වේ.

නෛකිත වශයෙන් මෙරට පුරාවිද්‍යා උරුමයේ ආරක්ෂාව සම්බන්ධයෙන් 1940 අංක 9 දරණ පුරාවස්තු ආඥාපනත, 1998 2ංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනත, 2006 ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය ආදිය ඉතා වැදගත් වේ. මෙයට අමතරව 1980 මධ්‍යම සංස්කෘතික අරමුදල, ගාලු උරුම පදනම පනත, සිගිරි උරුම පදනම පනත ආදිය මෙරට

උරුම කළමනාකරණයේ දී මැදිහත් වේ. වර්තමානයේ දී මෙම නෛතික ව්‍යුහයන් අභිබවා යමින් විවිධ මැදිහත්වීම් මත පුරාවිද්‍යා උරුමයන් විනාශවන දැකගත හැකි වේ. දේශපාලනික මැදිහත් වීම, ත්‍රස්තවාදී ක්‍රියා, සංවර්ධන ක්‍රියාවලි හා වාගාබිම් සඳහා භූමිය එළි කිරීම් මේ සඳහා බලපානු ලැබේ. එසේම ආයතනික වශයෙන් පවතින සුරක්ෂිතතාවයේ දුර්වලතා ආදිය එහි දී විශේෂිත වේ. පුරාවිද්‍යා දෙපර්තමේන්තුවේ මන්දගාමීත්වය හා උරුමයේ ආරක්ෂාව හා කළමනාකරණය සඳහා පවතින අවම මැදිහත් වීම මෙරට පුරාවිද්‍යා උරුමයේ සුරක්ෂිතතාවයට බාධාවක් වේ. එසේම විෂය සමගාමී නිලධාරීන් බඳවාගැනීමේ පටිපාටියේ පතින දුර්වලතා, විෂය සමගාමි උපාධිධාරීන් සඳහා ආයතනයට සම්බන්ධවීමට විධිමත් ක්‍රියාවලියක් නොවීම ද වර්තමානයේ දී පුරාවිද්‍යා කළමනාකරණය සම්බන්ධයෙන් පවතින අභියෝග වේ. මධ්‍යම සංස්කෘතික අරමුදල තුළ ද විෂය සමගාමි උපාධිධාරින් පුහුණ කිරීමත්, බඳවා ගැනීමෙන් ක්‍රියාවලිය ස්ථිර නොවන නිසා විෂය සමගාමී උපාධිධාරින් මෙම ආයතනයන්ට සම්බන්ධ වීමට මැළිකමක් දක්වයි. මෙහි උග්‍ර ගැටලුව වන්නේ තවත් දශක කිහිපයක් තුළ පුරාවිද්‍යා ක්ෂෙත්‍රයේ කඩාවැටීමක් සිදු විය හැකි වීමයි. එසේම සංවර්ධන සැලසුම් ද අනාගත අභියෝගයක් වේ. සංවර්ධනය යනු අත්‍යවශ්‍ය කරුණක් වන අතර එම සංවර්ධන කටයුතු සිදු කිරීමේ දී උරුමයේ ස්වාභාවයත් ආරක්ෂාත් ඒ සඳහාවන මැදිහත් වීම් ක්‍රමවේදයන්ගේත් පැහැදිලි බවක් හෝ නිශ්චිත නියාමන ව්‍යුහයක් සකසා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඇතැම් සංවර්ධන යෝජනාවලින් තුළ උරුමය විනාශ වී යාම ද ආරක්ෂා වීම් ද සිදු විය හැකිය. උරුම ප්‍රදේශයක් ආශ්‍රිතව සංවර්ධන කටයුත්තක් සිදු කරන්නේ නම් එය මානව මූලික අවශ්‍යතා මත පදනම් විය යුතු අතර උරුමයේ පැවැත්මට ඉන් දක්වන ඉහළම දායකත්වය කෙසේ ද යන්න අවබෝධ කර ගතයුතු වේ.

## සමාලෝචනය

ලාංකේය පුරාවිද්‍යා උරුම කළමනාකරණයේ ස්වරූපය පිළිබඳ විමසීමේ දී එය මානව මූලික අවශ්‍යතා මත පදනම් වෙමින් සිදු කර ඇති බව හඳුනාගත හැකි වේ. ඓතිහාසික යුගය තුළ මේ සඳහා රාජ්‍ය මැදිහත් වීම ඉතා ප්‍රබලව පැවතී ඇති බව සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය පරිශීලනයේ දී හඳුනාගත හැකි ය. එතුළ ඇතැම් විට පාලකයාගේ බලය හා ආගමික භක්තිය මනාව පෙන්නුම් කරයි. ප්‍රබල පාලකයින් මෙරට බෞද්ධ උරුමය ආරක්ෂා කිරීමට අමතරව නව විහාර කර්මාන්ත හා නවකම් කිරීම් කටයුතු සිදු කර ඇති බව පෙනේ. අනුරාධපුර යුගයෙන් පසුව ඇතිවන විදේශීය චෝළ ආක්‍රමණ හමුවේ මෙරට බෞද්ධ උරුමයන් කෙරෙහි හින්දු ආගමික සංකල්පයන් ද එක් වූ බවක් පොළොන්නරු යුගයෙන් පසුව සිදු කර ඇති විහාරාරාංග නිර්මාණය, නවකම් කිරීම් තුළින් පැහැදිලි වේ. කෙසේ වෙතත් පසු කාලීනව මෙරට රාජධානීන්ගේ පැවැත්ම තාවකාලික වීමත් ශිෂ්ටාචාරය රට මධ්‍ය ප්‍රදේශයට සංක්‍රමණය වීම හේතු කර ගනිමින් උරුම ස්ථාන නිර්මාණය වීමත් ඒ සඳහා යොදාගත් කළමනාකරණ ප්‍රතිපත්තීන් ද කාලීන වශයෙන් වෙනස් වූ බව හඳුනාගත හැකි වේ. එසේම මෙරට රාජාණ්ඩු පාලනය අහෝසි වීමෙන් පසුව යටත් විජිත නියෝජිතයන් මෙරට උරුමය පිළිබඳ ව සොයා බැලීම ආරම්භ කළ අතර රජරට ආශ්‍රිතව පැවති ශිෂ්ටාචාරයේ විස්මය දනවන ස්ථාන හඳුනාගැනීමත් අධ්‍යයනය කිරීමත් මෙමගින් සිදු විය. මෙහි දී 1890 බෙල් යුගය ඉතා සුවිශේෂී විය. පසුව 1940 පරණවිතාන යුගය තුළ

දේශීයත්වය මත පදනම් උරුම කළමනාකරණ සැලසුම් සකස් කිරීම ආරම්භ කෙරිණි. 1980 දශකයෙන් පසු උරුම ස්ථාන පිළිබඳ ව සොයා බැලීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා බද්ධ ආයතන පද්ධතීන් හා ව්‍යාපෘතින් ආරම්භ කිරීම නිසාත් විදේශීය ප්‍රතිපත්තීන් අනුග මනය කිරීම නිසාවෙන් උරුමයේ සුරක්ෂිතභාවය ඉහළ ගිය බවක් හඳුනාගත හැකි වේ. එහෙත් කාලීන වශයෙන් සිදු කර ඇති අවශ්‍යතා මත පදනම් වූ තීන්දු තීරණයන් පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී වර්තමාන යුගයේ දී සුවිශාල කාලීන ගැටලු ප්‍රමාණයක් පවතින බව හඳුනාගත හැකි වේ. මෙහිලා බලපෑ කරුණු කිහිපයක් ලෙස උරුම කළමනාකරණය දේශපාලනීකරණය වීම, සංවර්ධන යෝජනාවලීන්ගේ ඇති විවිධතාවයන් හා මානව මානසික මට්ටම් පිළිබඳ පවතින දුර්වලතා ලෙස දැක්විය හැකි වේ. ඉහත ගැටලු නිරාකරණය කර ගැනීමට හැකියාව පවතින්නේ නම් කාලීන වශයෙන් පුරාවිද්‍යා උරුමයට පවතින අභියෝග යන් ජය ගැනීමට හැකියාව පවතී.

## පරිශීලිත ග්‍රන්ථ


**චුල්ලවග්ගපාළිය (02 කාණ්ඩය)** (2006), බලංගොඩ ආනන්ද මෛත්‍රී, උඩුවේ ජනානන්ද ස්ථවිර, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2006

**මහාවංශය (ප්‍රථම භාගය)**, (1996), ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ.

**මහාවංශය (ද්විතීය භාගය)**, (1996), ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ.

**පූජාවලිය** (1997), ඤාණවිමල, කේ.(සංස්:), ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ.

**රාජාවලිය** (1997), සුරවීර, ඒ.වී. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

කරුණාරත්න, එස්., (2000), **ශිලාලේඛන සංග්‍රහය (මිහින්තලේ සිව්වන මිහිඳුගේ පුවරු ලිපි දෙක)**, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

ගුණවර්ධන, ආර්., (1993), **සිවුර හා නගුල**, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ.

ගුණවර්ධන, පී., (2005), **පුරාවිද්‍යා උරුමය ආකෘති, සංකල්ප සහ කළමනාකරණය**, සමන්ති පොත් ප්‍රකාශකයෝ, රාජගිරිය.

තෙන්නකෝන්, එම්.යූ.ඒ. තෙන්නකෝන්, වී., (2005), **එදා වැව් බැඳි රාජ්ජේ හෙවත් ලංකා සිවිල් සේවයේ ආර්. ඩබ්ලිව්. අයිවර්ස්ගේ උතුරු මැද පළාතේ අත්පොත 1899**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ.

මැන්දිස්, ටී. විතානච්චි, සී.ආර්., (2015), **පුරාවිද්‍යා ගවේශණ කැනීම් හා කාලනිර්ණ ක්‍රම**, කර්තෘ ප්‍රකාශන, නිහාල් ප්‍රින්ටර්ස්, කුරුණෑගල.

මල්සිරි, ඩබ්.අයි., (2011), **ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යා උරුම සංරක්ෂණයේ ඓතිහාසික විකාශය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

රාජපක්ෂ, ඒ., (2001), **සංස්කෘතික පුරාණය, නව ශාස්ත්‍රීය සංග්‍රහය, 4 කලාපය (ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පුරාවිද්‍යා උරුම කළමනාකරණ ක්‍රියාදාමය)**, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

වත්තල. එස්., (1998). **අනුරාධපුර විහාරාරාම**, මධ්‍යම සංස්කෘතික අරමුදල: කොළඹ.

**1940 අංක 9 දරණ පුරාවස්තු ආඥා පණත**, ගවේශණ හා ලේඛනගත කිරීමේ අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

Fagan, B.M., (1991), ***An introduction to Archaeology***, In Beginning, New York.

Saunders, A., (1986), ***In Archaeological Heritage Management in the modern world***, England.

sri lanka world heritage, Retrieved on 2017.11.22 from http://whc.unesco.org/en/ statesparties/lk